සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 44 S |
|---|---|---|

නම ..............................................  නැටුම් I කොටස  **කාලය පැය දෙකයි**

**උපදෙස් :** **සියලුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**

**● 1 - 5 දක්වා වූ ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01.තෙයිත තෙයිත තෙයිත යතාම් යන පා සරඹයේ සරඹ නාමය වන්නේ
1. අඩිය   2. දෑඩිය   3. තුන් අඩිය   4. සිව් අඩිය

02.' කුද ගත ගත දොම්' යන බෙර පදය අයත් තිත වන්නේ
1. මැදුම් තනි තිත   2. සුළු තනි තිත
3. මහ තනිතිත   4. සුළු මැදුම් දෙතිත

03.'ලෙල දෙමිනේ මල උඩු ගුවනේ' ...... යන ජන කවිය අයත් වන්නේ
1. තලමල වරුණ   2. කළ   3. ලී කෙළි   4. කුළු

04.සාම්ප්‍රදායික පද ඇසුරින් නිර්මාණය කරගන්නා ලද පද හඳුන්වන්නේ
1. බෙරපද නමිනි   2. හමාර පද නමිනි
3. සරඹ පද නමිනි   4. අලංකාර පද නමිනි.

05.දික් දිගට කොළ ඇති - ඒ මැදට ගැට ඇති යන රබන් පදය අයත් තාල රූපය වන්නේ
1. 2+3 තාල රූපය   2. 3+3 තාල රූපය
3. 2+2 තාල රූපය   4. 4+4 තාල රූපය

**● අංක 6 - 10 දක්වා 'අ' කොටසෙහි දිඇතිපදවලට ගැළපෙන පද 'ආ' කොටසින් තෝරා යා කරන්න.**

| 'අ' | 'ආ' |
|---|---|
| 06. මාත්‍රා 2+ 3 තාලය | කොහොඹා කංකාරිය |
| 07. හනුමා | දණ්ඩි සරඹ |
| 08. කස්තිරම | ගොඩ සරඹ |
| 09. හමාර පදය | වන්නම |
| 10. ගැට බෙරය | දොං ජිංත ගත දොංත |

**● අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන සම්පූර්ණ කරන්න.**
(සීරු මාරුව, අඩව්ව, මණ්ඩිය, දවුල බෙරය, තාලම්පට)

11. නර්තනයේ මූලික අංග හාරය .................................... ලෙස හැඳින්වේ.

12. නර්තන සම්ප්‍රදායන්හිතාල තැබීම සඳහා ............................................ භාවිතා කරයි.

13. වන්නමක අවසාන පද කොටස නැටීමට පෙර නටනු ලබන පද කොටස ............................... නම් වේ.

14. ...................................... විකල්ප වාද්‍ය උපකරණයකි.

15. තත් තොග තක තොග යනු හනුමා වන්නමේ ....................................... වේ.

●අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට අදාළව ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

16. පා සරඹ නැටීමේ දී භාවිතා කරන උපකරණයකි.

17. තාලයේ නිහඬ බව (-----) හඳුන්වන්නේ මේ නමිනි.

18. වර්ණනාව යන අර්ථයෙන් රචිත ගායනා විශේෂයකි.

<u>පහළට</u>

19. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධානවාද්‍ය භාණ්ඩය වේ.

20. ගොඩ සරඹ අවසන්කරන පද කොටසකි.

| | | | | |
|---|---|---|---|---|
| 16 19 ද | | | 20 ක | |
| | | | | |
| | | 17 ය | | ය |
| | | | | |
| 18 ව | | | | |

# II කොටස

(01) ඔබේ නැටුම් ගුරුතුමා / ගුරුතුමිය විසින් දෙන ලද 'වැසි දිනක අසිරිය' පිළිබඳ කියවෙන පහත ගීතය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අක්කෙ අක්කෙ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ .... //
හෝ හෝ හෝ ගාගෙන එන්නේ
ගස් ගල් පෙරළෙන්නේ ................//

සුළං තදයි විදුලිය ද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහ වළාකුළක් නොවැ එන්නේ

i. උක්ත ගීතයේ ඉරි ඇඳි පද වලින් ප්‍රදර්ශනය කළ හැකි චලන ක්‍රියාකාරකම් ඉදිරියෙන් ලියන්න.

| | පරිසරය සිදුවීම | ක්‍රියාකාරකම |
|---|---|---|
| උදාඃ- | සුළඟ | කැරකීම |
| | 'අ' හෙණ හඬ | ................................ |
| | 'ආ' විදුලිය | ................................ |
| | 'ඇ' ගස් ගල් පෙරලීම | ................................ |

(ල. 03)

ii. උක්ත ගීතයේ ඉරිඇඳි පදවලට ශබ්දය නිපදවිය හැකි විකල්ප වාද්‍ය උපකරණය බැගින් ලියන්න. උදාහරණයන් දක්වා ඇත.

| පරිසර සිදුවීම | විකල්ප වාද්‍ය උපකරණය |
|---|---|
| උදාඃ- හෝ හෝ හඬ (සුළං) | පොල් කටුදෙකක් |
| 'අ' හෙණ හඬ | ............................ |
| 'ආ' වැස්ස | ............................ |
| 'ඇ' ගස්ගල් පෙරළීම | ............................ |

(ල. 03)

ii. පිඹීමෙන් ශබ්දය නිපදවිය හැකි විකල්පවාද්‍ය උපකරණයක් අඳින්න. (ල. 04)

(02) වන්නම් යනු වර්ණනාත්මක ගායනා විශේෂයකි.
i. හනුමා වන්නමේ තිත නම් කරන්න. (ල. 02)
ii. එයින් නැවත පළතුරින් තුරට පැන යන කවිය සම්පූර්ණ කරන්න. (ල. 04)
iii. හනුමා වන්නමට අදාළ බෙර පදය ප්‍රස්තාර කරන්න. (ල. 04)

(03) ජන ගායනා තුළින් ගැමියාගේ අව්‍යාජ බව පිළිඹිබු කරයි.
i. ජන ගායනා වල සුවිශේෂී ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)
ii. තලමල වරුණ කවියක් ලියන්න. (ල. 04)
iii. ජන ගායනා සංරක්ෂණය කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග 02 ක් ලියන්න. (ල. 04)

(04) මූලික සරඹ අභ්‍යාසය තුළින් ආධුනිකයාගේ මූලික අංගහාර ගොඩනැගේ.
i. පා සරඹ නැටීමේ දී යොදා ගන්නා වාද්‍ය භාණ්ඩය ලියන්න. (ල. 02)
ii. තුන්වන ගොඩ සරඹ නාමය සහ කස්තිරම ලියන්න. (ල. 04)
iii. ගොඩ සරඹ අභ්‍යාසයෙන් ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 04)

(05) පහත සඳහන් පාරිභාෂිත වචන අතරින් 2 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
I. නම්‍යතා අභ්‍යාස ii. ගැමි නැටුම් iii. ගැට බෙරය iv. අලංකාර මාත්‍රා

පළමු වාර පරීක්ෂණය - 2019

07 ශ්‍රේණිය නර්තනය

පිළිතුරු පත්‍රය

# I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 4 | 6 - දොං ජිංත ගත දොංත | 11 - මණ්ඩිය | 16 - දණ්ඩිකඳ |
| 2 - 3 | 7 - වන්නම | 12 - තාලම්පට | 17 - යතිය |
| 3 - 1 | 8 - ගොඩ සරඹ | 13 - සීරු මාරුව | 18 - වන්නම |
| 4 - 4 | 9 - දණ්ඩි සරඹ | 14 - දඬු බෙරය | 19 - දවුල |
| 5 - 1 | 10 - කොහොඹ කංකාරිය | 15 - අඩව්ව | 20 - කස්තිරම |

(ලකුණු 1x 20 = 20)

## II කොටස

(01) i. (ආ) භාව නිරූපණ
(ආ) පැනීම හා සම්බන්ධ චලන
(ඇ) ස්ථිතික චලන (ල. 1 x 3 = 3)

ii. ගැළපෙන විකල්ප වාද්‍ය උපකරණයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 1 x 3 = 3)

iii. නිවැරදි පිළිතුරට ලකුණු ලබාදෙන්න. (ල. 04)

(02) i. සුළු තනි තිත (ල. 02)

ii. කවිය සම්පූර්ණ කර ඇත්නම් - (එක් කවි පාදයකට 1 බැගින් ලකුණු 04)

iii.

| / | / | / | / |
|---|---|---|---|
| 1 2 | 1 2 | 1 2 | 1 2 |
| කු ද | ග ත | ග ත | දොමි |
| | | | |

(03) i. සාමූහික බව, සරල බව, එමකීම, රංග උපකරණ භාවිතය ආදී වශයෙන් නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ල. 02)

ii. තලමල වරුණ කවියක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (පාදයකම 1 බැගින් ලකුණු 04)

iii. නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (කරුණු 2 x 2 = ල. 04)

(04) I. තාලම්පට

ii. තුන් අඩිය - ගත්තකු ජිත්තම් ගජිතතු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොමිකිට තා

iii. නිවැරදි අංගහාර සකස් කර ගැනීම
මූලික අංගහාරය සකස් වීම.
තාලය හා ලය පිළිබඳ මූලික දැනුම ලැබීම
ආදි වශයෙන් නිවැරදි පිළිතුරකට ලකුණු ලබාදෙන්න. (කරුණු 2x 2 =04)

(05) පිළිතුර නිවැරදි නම් කරුණු 5 ට ලකුණු 05 බැගින් (5x 2 = 10)